**2022 ජුනි මස 17 වන දින පැවති**

**පනස් වන මහ සභා රැස්වීමේ කෙටුම්පත් වාර්තාව**

**දිනය :-2022.06.17**
**ස්ථානය :- නැගෙනහිර නුවරගම් පළාත ප්‍රාදේශීය සභාව**
**වේලාව :- පෙ.ව 10.00**
**සහභාගී වූ :-**

| | | | |
|---|---|---|---|
| **01.** | ගරු සභාපති | එස්.බී කුමාරදාස මැතිතුමා | ( ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ) |
| **02.** | ගරු මන්ත්‍රී | බී.ඒ.ජී.එම්.කේ.ජී.ජී කුමාරි මැතිනිය | ( ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ) |
| **03.** | ගරු මන්ත්‍රී | බී.බී.ඊ ගයාන් චාමර මැතිතුමා | ( ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ) |
| **04.** | ගරු මන්ත්‍රී | කේ.ඒ සංජීව මැතිතුමා | ( ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ) |
| **05.** | ගරු මන්ත්‍රී | ජේ.ඒ.ඩී විමලසිරි මැතිතුමා | ( ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ) |
| **06.** | ගරු මන්ත්‍රී | ජේ.ඒ ජයවර්ධන මැතිතුමා | ( ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ) |
| **07.** | ගරු මන්ත්‍රී | පී.එස්.බී සිරිවර්ධන මැතිතුමා | ( ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ) |
| **08.** | ගරු මන්ත්‍රී | එච්.ඩබ්.ජී.එන් කුමුදු වසන්ති මැතිනිය | ( ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ) |
| **09.** | ගරු මන්ත්‍රී | පී.ටී සිරිසේන මැතිතුමා | ( ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ) |
| **10.** | ගරු මන්ත්‍රී | ආර්.එම් කුමාරසිංහ මැතිතුමා | ( එ.ජා.ප) |
| **11.** | ගරු මන්ත්‍රී | ඩී.පී බන්දුලසේන මැතිතුමා | ( ශ්‍රී.ල නි.ප) |
| **12.** | ගරු මන්ත්‍රී | එම්.ඒ විමලසුරේන්ද්‍ර මැතිතුමා | ( එ.ජා.ප) |
| **13.** | ගරු මන්ත්‍රී | ඩී.එම්.එන් සුභාෂිණි බංඩාර මැතිනිය | ( එ.ජා.ප) |
| **14.** | ගරු මන්ත්‍රී | එස්.ඒ.කේ.පී ගුණවර්ධන මැතිතුමා | ( ජ.වි.පෙ) |
| **15.** | ගරු මන්ත්‍රී | කේ. හැරිසෙන්ස් මැතිතුමා | ( ජ.වි.පෙ) |

**දන්වා සහභාගී නොවූ:-**

| | | | |
|---|---|---|---|
| **16.** | ගරු උප සභාපති | එම් සරත් ප්‍රේමචන්ද්‍ර මැතිතුමා | ( ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ) |
| **17.** | ගරු මන්ත්‍රී | කේ.ඒ ශාන්ත මැතිතුමා | ( ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ) |
| **18.** | ගරු මන්ත්‍රී | ආර්.එම්.අයි ජනක ශ්‍රිමාලි මැතිනිය | ( එ.ජා.ප) |
| **19.** | ගරු මන්ත්‍රී | වයි.එම් ගාමිණි බංඩාර මැතිතුමා | (ස්වාධීන කණ්ඩායම) |
| **20.** | ගරු මන්ත්‍රී | පී කරුණාරත්න මැතිතුමා | ( ශ්‍රී.ල නි.ප) |
| **21.** | ගරු මන්ත්‍රී | ජී.ඒ නෙළුම් මැතිනිය | ( එ.ජා.ප) |

**නිළධාරීන්:-**

**01.** ලේකම් බී.එච් ප්‍රදීප් නිශාන්ත මයා

**02.** විෂය භාර කළමණාකරන සේවා නිළධාරී අයි.ජී.සී.එන් වීරකෝන් මිය

<u>ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා</u> ගරු මන්ත්‍රිතුමන්ලා හා ගරු මන්ත්‍රිතුමියන්ලා වෙත සුභ උදෑසනක් ප්‍රාර්ථනය කරමින්, ඉතාම ආදරයෙන් ගෞරවයෙන් පිළිගනිමින් න්‍යායපත්‍රානුකූලව සභාවේ වැඩ කටයුතු ආරම්භ කරන ලදී.

අනතුරුව ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා 9 වනදා සිදුවීම සිදු වූ අවස්ථාවේදී මියගිය ගරු අතුකෝරල මන්ත්‍රීතුමා ඇතුළු මියගිය සියලු දෙනා වෙනුවෙන් හා රබෑව ප්‍රාදේශීය සභාවේ මියගිය ගරු සභාපති තුමා වෙනුවෙන් වනාඩි 2 ක නිශ්ශබ්දතාවයක් පවත්වන මෙන් ඉල්ලා සිටින ලද අතර පැමිණ සිටි සියළුම දෙනා විනාඩියක නිශ්ශබ්දතාවය පල කරන ලදී.

**අ) මහ සභා වාර්ථාව සභා සම්මත කර ගැනීම.**

**<u>2022.05.17 වන දින මහ සභා කෙටුම්පත් වාර්ථාව</u>**

<u>ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා</u> 2022.05.17 දින පැවැත් වූ මහ සභා රැස්වීමේ කෙටුම්පත් වාර්තාව ප්‍රාදේශීය සභා රීතීන්ට අනුව ඔබ වෙත ලැබීමට සළස්වා ඇති බැවින් එම වාර්ථාවේ අඩුපාඩු ඇත්නම් සංශෝධනයන්ට යටත්ව සභා සම්මත කර ගන්නා ලෙස ප්‍රකාශ කරමින් 2022.05.17 මහ සභා කෙටුම්පත් රැස්වීම් වාර්ථාව සංශෝධනයන්ට යටත්ව සභා සම්මත කිරීම සුදුසු බවට යෝජනා කරන ලදී.

<u>සංශෝධන</u>

<u>ගරු මන්ත්‍රී පී.එස්.බී සිරිවර්ධන මැතිතුමා</u> තමන් ගියවර මහ සභාවට පැමිණි බවත්, ඒය සභා වාර්ථාවේ අන්තර්ගත වී නොමැති බැවින් තමා පැමිණි බවට සංශෝධනය විය යුතු බව ප්‍රකාශ කරන ලදී.

<u>ගරු මන්ත්‍රී ජේ.ඒ.ඩී විමලසිරි මැතිතුමා</u> ඉදිරිපත් වූ සංශෝධනයන්ට යටත්ව 2022.05.17 වන දින පැවති මහ සභාවේ වාර්ථාව සංශෝධන සහිතව සභා සම්මත කිරීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් ගෙන ආ යෝජනාව ස්ථිර කරන ලදී.

ඒ අනුව 2022.05.17 වන දින මහ සභා රුැස්වීම් කෙටුම්පත් වාර්ථාව සංශෝධනයන්ට යටත්ව සභා සම්මත විය.

ගරු මන්ත්‍රී කේ.ඒ සංජීව මැතිතුමා පෙ.ව. 10.10 ට ගරු සභාවට පැමිණ අසුන් ගන්නා ලදි.

**අ) සභාපතිතුමන් විසින් කරනු ලබන විශේෂ නිවේදන**

01. 2021 වර්ෂය සඳහා වත්කම් බැරකම් ප්‍රකාශ ලබා දීම

<u>ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා</u> පළාත් පාලන ආයතනය වෙත තේරී පත්වී ඇති සියළුම ගරු සභික මහත්ම මහත්මීන්ගේ සහ සේවයේ නියුතු සියළුම මාණ්ඩලික නිළදාරීන්ගේ 2021 වර්ෂය සඳහා ඉදිරිපත් කල යුතු වත්කම් බැරකම් ප්‍රකාශ නිවැරදි ආකෘතියට අනුව සම්පූර්ණ කර ජුනි මස 30 වන දිනට පෙර පළාත් පාලන දෙපාර්තමේන්තුව වෙත එවීමට කටයුතු කරන ලෙසට දන්වා ඇති ලිපිය මහ සභාවට නිවේදනය කරන ලදී.

ගරු මන්ත්‍රී කුමුදු ප්‍රියන්ත මැතිතුමා පෙ.ව. 10.12 ට ගරු සභාවට පැමිණ අසුන් ගන්නා ලදි.

**02. පුනර්ජනනීය බලශක්ති ප්‍රභවයන් සඳහා වන දායකත්වය ඉහල නැංවීම.**

<u>ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා</u> පළාත් සභා හා පළාත් පාලන කටයුතු රාජ්‍ය අමාත්‍යාංශ ලේකම්ගේ අංක PI/03/01/03 හා 2022.05.30 දිනැති ලිපිය මගින් සූර්ය බලය හා සුලං බලයෙන් විදුලිය නිශ්පාදනය ,ජීව වායු භාවිතය ප්‍රචලිත කිරිම වැනි විකල්ප බලශක්ති භාවිතයන් කෙරෙහි ජනතාව යොමු කිරිමේ මූලික

පියවරක් ලෙස පළාත් පාලන ආයතනයන් මූලික කරගෙන පෞද්ගලික අංශයේද සහයෝගය ඇතිව ව්‍යාපෘති ක්‍රියාත්මක කිරිම සිදු කල යුතු බවට වූ ලිපිය මහ සභාවට නිවේදනය කරන ලදී.

තවද මේ තුළින් ජාතික වශයෙන් යම් දායකත්වයක් ලබා දීමේ අවස්ථාවද සැලසෙන අතර පොදු මහජනතාවට ද මෙවැනි ව්‍යාපෘති ක්‍රියාත්මක කර ආර්ථික වාසි ලබා ගැනීමට හැකි වන බවත්, විකල්ප බලශක්ති භාවිතය පිළිබඳව මහජනතාව දැනුවත් කිරිම තුලින් ආර්ථික වාසි ලබා ගැනීමට හැකි බව පෙන්වා දිය හැකි පරිදී පලාත් සභා හා පළාත් පාලන කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය මගින් උතුර,උතුරු මැද,ඌව හා නැගෙනහිර යන පළාත් වල ක්‍රියාත්මක වන ප්‍රාදේශීය සංවර්ධන සහයක ව්‍යාපෘතියෙන්ද (LDSP) මෙවැනි ව්‍යාපෘති සඳහා අවශ්‍ය මූල්‍ය සහය ලබා ගත හැකි වන අතර,දේශීය ණය සංවර්ධන අරමුදල LLDF යටතේද මෙවැනි යෝජනා සඳහා පළාත් පාලන ආයතන වෙත ණය පහසුකම් ලබා දීමේ හැකියාවද පවතින බව වැඩිදුරටත් කරුණු දක්වමින් සඳහන් කරන ලදී.

**ආ) ප්‍රාදේශීය සභාව වෙත අමතා එවන ලද සංදේශ පෙත්සම්, පැමිණිලි සහ සන්නිවේදන**

**නැත.**

**ඇ) යථා පරිදි කල් දී ඇති ප්‍රශ්ණ**

**නැත.**

**ඉ) යථා පරිදී කල් දී ඇති යෝජනා**

**01. 2022 ජූලි මස සේවකයින්ගේ අතිකාල තක්සේරු වාර්ථා අනුමත කිරීම.**

<u>ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා</u> 2022 ජූලි මසට අදාලව කාර්යය මණ්ඩලය විසින් අතිකාල ඉල්ලීම් කර ඇති අතිකාල තක්සේරු වාර්ථා සභාවට ඉදිරිපත් කරමින් අදාල සේවකයින් වෙත අතිකාල තක්සේරු වාර්තා අනුමත කිරිම සුදුසු බවට යෝජනා කරන ලදී.

**<u>2022 ජූලි</u>**

| | | පැය ගණන |
|---|---|---|
| 01. අයි.ජී.සී.එන් වීරකෝන් මිය | (කළ.සේවා නිළධාරී) | 40 |
| 02. ඩී.යූ දිසානායක මයා | (කළ.සේවා නිළධාරී) | 40 |
| 03. එම්.එස්.එම් ගුණවර්ධන මිය | (කළ: සේවා නිළධාරී) | 60 |
| 04. ටී.එච්.ඩී.ඩී පෙරේරා මයා | (මුරකරු(ආවරණ) | 40 |
| 05. එම් ආර්.පෙරේරා මයා | (මුරකරු) | 75 |
| 06. එස් අන්තෝනි මයා | (මාර්ග කම්කරු) | 40 |
| 07. සුභාෂ් ගයාෂාන් මයා | (අනියම් රියදුරු) | 40 |
| 08. බන්දුල දිසානායක | (මුරකරු ආවරණ) | 75 |

<u>ගරු මන්ත්‍රී බී.ඒ.ජී.එම්.කේ.ජී.ජී කුමාරි මැතිනිය</u> 2022 ජූලි මසට අදාල අතිකාල ඉල්ලුම් කර ඇති සේවකයින්ගේ අතිකාල තක්සේරු වාර්ථා අනුමත කිරිම සුදුසු බවට ගරු සභාපති තුමා කල යෝජනාව ස්ථිර කරන ලදී.

<u>ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා</u> අතිකාල තක්සේරු වාර්තා අනුමත කිරීමේ යෝජනාව සම්බන්ධයෙන් යම් විරෝධතාවයක් පවතීද යන්න විමසූ අතර කිසිදු විරෝධතාවයක් ඉදිරිපත් නොවූ බැවින් 2022 ජූලි මස අතිකාල ඉල්ලුම්කල සේවකයින් වෙත අතිකාල තක්සේරු වාර්ථා අනුමත කිරීමේ යෝජනාව පැමිණ සිටි සියළු මහජන නියෝජිතයන්ගේ එකගතාවයෙන් සභා සම්මත විය.

**02. ක්ෂේත්‍ර නිළධාරීන් වෙත අමතර ඉන්ධන දීමනාවක් ලබා දීම.**

ගරු සභාපති එස්. බී කුමාරදාස මැතිතුමා ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ආදායම් එක් රැස් කිරීමේදී හා අනෙකුත් ක්ෂේත්‍ර කටයුතු වල නිරත වීමේදි දැනට රටේ පවතින ඉන්ධන වල මිල ගණන් සීඝ්‍ර ලෙස ඉහල යෑම හේතුවෙන් ඉන්ධන සඳහා විශාල පිරිවැයක් දැරීමට සිදු වී ඇති බැවින් දැනට ලබා ගන්නා ගමන් වියදමට අමතරව එක් අයෙක් සඳහා මාසිකව රු.2500.00 බැගින් අමතර දීමනාවක්, ලබා දෙන ලෙස ඉල්ලීම් කර ඇති බවත්, දැනට මෙම සභා බල ප්‍රදේශය තුළ පවත්නා ව්‍යාපාර සඳහා 2022 වර්ෂයට එකතු කල යුතු වන ව්‍යාපාර බදු ඇස්තමේන්තු මුදල රු.2,000,000.00 ක් වන අතර දැනට අය වී ඇත්තේ රු.694,640.00 ක්ද, කර්මාන්ත බදු මුදල වන රු.135,000.00 කින් දැනට අය වී ඇත්තේ රු.40,500.00 ක් ද,වෙළඳ බලපත්‍ර ඇස්තමේන්තු මුදල රු.165,000.00 කින් දැනට අය වී ඇත්තේ රු.31,000.00 ක් වන අතර, දැන්වීම් පුවරු ඇස්තමේන්තු මුදල රු.1,000,000.00 කින් දැනට අය වී ඇත්තේ රු.35,950.00 ක මුදලක් බවත්, ඊට අමතරව මාසික කඩ කුලිය අය කිරිමට, මාසික ටෙන්ඩර් කුලි අය කිරිමට හා නව ව්‍යාපාරික ස්ථාන පරික්ෂාවද, නිවාඩු නිකේතන පරික්ෂාවන් හා ජල පිරි පහදු මධ්‍යස්ථාන පරීක්ෂාවන්ද, අනෙකුත් ක්ෂේත්‍ර නිළධාරීන් විසින් ක්ෂේත්‍ර පරීක්ෂාවන්ද, අනවසර ඉදි කිරීම් පරීක්ෂාවන්ද සිදු කළ යුතුව ඇති බැවින් එම කරුණු සලකා බලා දැනට හිමි වන ක්ෂේත්‍ර දීමනාවට අමතරව රු 2500.00 ක අමතර දීමනාවක් ලබා දීමට කටයුතු කිරීම සුදුසු බවට යෝජනා කරන ලදි

| | පවතින දීමනාව | වැඩි කිරීම් සඳහා ඉල්ලුම් කර ඇති අමතර දීමනාව |
|---|---|---|
| ලේකම්තුමා | 6,000 | 2,500 |
| තාක්ෂණ නිළධාරි | 4,800 | 2,500 |
| තාක්ෂණ සහයක | 4,200 | 2,500 |
| සංවර්ධන නිළධාරී | 4,800 | 2,500 |
| ආදායම් පරික්ෂකද | 4,800 | 2,500 |

ගරු මන්ත්‍රී ආර්.එම් කුමාරසිංහ මැතිතුමා වර්ථමානයේ පවතින ඉන්ධන ගැටලුව හෙතුවෙන් අදාළ නිළධාරීන් වෙත පැමිණීමේ දුෂ්කරතාවය මත ඒ ඉන්ධන දීමනාව ලබා දීම සුදුසු බව හා ඒ යොජනාව ස්ථිර කරන බවත් සභාවේ අනෙක් නිළධාරීන් සඳහා ද අවම රුපියල් 1,000 ක හෝ දීමනාවක් ලබා දීම සුදුසු බවටත් යෝජනා කරන ලදි.

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා රාජ්‍ය වියදම් අවම කිරීම සඳහා පියවර ගෙන ඇති අවස්ථාවක අනෙක් නිළධාරීන් සඳහා ඉන්ධන දීමනාවක් ලබා දීම නීත්‍යානුකූල නොවන බැවින් ක්ෂේත්‍ර නිළධාරීන් සඳහා අමතර ඉන්ධන දීමනාවක් ලබා දීම පමණක් ප්‍රමාණවත් බව ප්‍රකාශ කරන ලදි.

ගරු මන්ත්‍රී බී.බී.ඊ ගයාන් චාමර මැතිතුමා ගරු ආණ්ඩුකාර තුමාගේ අනුමැතියට යටත්ව ඉදිරිපත් කල ඇති ක්ෂේත්‍ර නිළධාරීන් සඳහා අමතර ඉන්ධන දීමනාවක් ලබා දීම සුදුසු බවට වූ යෝජනාව ස්ථිර කරන ලදි.

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා ඉදිරිපත් කල යෝජනාව සම්බන්ධයෙන් යම් විරෝධතාවයක් පවතින්නේද යන්න විමසූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවූ බැවින් ක්ෂේත්‍ර නිළධාරීන්ට ඉන්ධන දීමනාවට අමතරව තවත් රු 2500 ක දීමනාවක් ලබා දීමේ යෝජනාව පැමිණ සිටි සියළු මහජන නියෝජිතයන්ගේ එකඟතාවයෙන් සභා සම්මත විය.

**03. 247 ගල්වල පාරේ පවතින පටු මංමාවත් දේදුණු පටුමඟ නමින් නම් කිරීම.**

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා 247 වන්නියම්කුලම ග්‍රාම නිලධාරී වසමේ ගල්වල පාරේ පවතින පටු මාවත් 3ක් කාලයාගේ ඇවෑමෙන් ඉඩම් ලබා පැමිණි නව පවුල් පදිංචි වීම සහ දරුවන් විවාහ වීමෙන් වෙන් වෙන්ව නිවෙස් තනා පදිංචි වීමෙන් දැනට පවුල් 20 ක් පමණ පදිංචිව සිටින අතර එම පවුල් වල සමාජ සම්බන්ධතා අනුව ගැටළුවකින් තොරව ලිපිනයන් පාවිච්චි කිරිමේ අවශයතාවයද දැඩි සේ මතු වී ඇති බවත්, තැපැල් ලිපි බෙදා හැරීමේදී පහසුවෙන් සොයා ගැනීම සඳහාත්, බාහිරින් මෙම ලිපිනයන් සොයා පැමිණෙන අයගේ හා ඥාතීන්ගේ පහසුව උදෙසාත්, ගල්වල පාරේ පිහිටුවාගෙන තිබෙන දේදුණු සුභ සාධක සමිතිය මගින් මෙම අවශ්‍යතාවය හදුනාගෙන එහි සාමාජිකත්වයේ යෝජනා ස්ථිර කිරිමෙන් මෙම පටු මාවත් සඳහා දේදුණු 1 පටුමග, දේදුණු 2 පටුමග, දේදුණු 3 පටුමග ලෙස නම් යෙදීමට ඉල්ලුම් කර ඇති බැවින් එලෙස මාර්ග නම් කිරීම සුදුසු බවට යෝජනා කරන ලදී.

ගරු මන්ත්‍රී ඩී.පී බන්දුලසේන මැතිතුමා අදාල අතුරු මාර්ග වල විරෝධතා හා ඒකඟතාවයන් විමසා දැන්වීමක් එළ කිරීමෙන් අනතුරුව ඒම මාර්ග නම් කිරීම සුදුසු බවට ප්‍රකාශ කරන ලදි.

ගරු මන්ත්‍රී බී.ඒ.ජී.එම්.කේ.ජී .ජී කුමාරිහාමි මැතිණිය ගරු සභාපතිතුමා විසින් ගෙන ආ යෝජනාව ස්ථිර කරන ලදී.

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා ඉදිරිපත් කල යෝජනාව සම්බන්ධයෙන් යම් විරෝධතාවයක් පවතින්නේද යන්න විමසූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවූ බැවින් **තුලාන අංක 247 ගල්වල පාරේ "දේදුනු පළමු - පටුමග ",දේදුනු දෙවන පටුමග,දේදුනු තෙවන පටුමග,නමින් මාවත් නම් කිරිමේ** යෝජනාව පැමිණ සිටි සියළු මහජන නියෝජිතයන්ගේ එකඟතාවයෙන් සභා සම්මත විය.

**04. 2022 වර්ෂයේ ජුලි මස සිට දෙසැම්බර් මස දක්වා කාලය සඳහා ජයබිම උත්සව ශාලාව බදු දීම**

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා ප්‍රාදේශීය සභාවට අයත් මෙතෙක් ප්‍රාදේශීය සභාව මගින් පවත්වා ගෙන යන ජයබිම උත්සව ශාලාව 2022 ජුලි මස සිට දෙසැම්බර් මස දක්වා කුඩා නෙළුබෑව හිදෝගම ලිපිනයේ පිහිටි කම්පාස් ඇඟලුම් ආයතනය විසින් සේවක සේවිකාවන් සඳහා නවාතැන් පහසුකම් ලබා දීම වෙනුවෙන් බදු පදනමින් ලබා දෙන ලෙසට ඉල්ලීම් කර ඇති බැවින් ඒ සඳහා දැනට ලබන ආදායම සැළකිල්ලට ගෙන බදු පදනමින් ලබා දීම සුදුසු බවට යෝජනා කරන ලද අතර අදාල ගිවිසුම් පත්‍රය මහ සභාවට ඉදිරිපත් කරන ලදී.

ගරු මන්ත්‍රී ආර්.එම් කුමාරසිංහ මැතිතුමා මෙම ඉල්ලීම කළ ඇති ආයතනය බල ප්‍රදේශයේ වටිනා හොඳ ආයතනයක් බවත් මෙම බදු දීම කෙටි කාලීනව නොව අවම වසර 5 ක් හෝ වන ලෙසට සාධනීයව ලබා දීම සුදුසු බවට ප්‍රකාශ කරන ලදි. තවද මෙම ගිවිසුම ආශ්‍රිත කටයුතු කිරීමේදි නිතීඥ මහතෙකුගේ සහය ලබා ගෙන කටයුතු කිරීම සුදුසු බවට ප්‍රකාශ කරමින් මෙම යෝජනාව ස්ථිර කරන ලදි.

ගරු මන්ත්‍රී ඩී.පී බන්දුලසේන මැතිතුමා මෙහිදී මාසිකව විශාල මුදලක් ලැබෙන බවත් ගියවර බදු දිමේදී ඊට අදාල ගිවිසුම තුලින් සාර්ථක ගිවිසුම් ගත වීමක් සිදු නොවූ බවත් ඒම භූමියේ පරිසර අලංකරණයට ද හානි අති වූ බැවින් ඒ පිළිබඳ සලකා මෙවර නිවැරදිව සැකසූ ගිවිසුමකට අනුව බදු දීමට කටයුතු කරන ලෙසට ප්‍රකාශ කරන ලදි.

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා ඉදිරිපත් කල යෝජනාව සම්බන්ධයෙන් යම් විරෝධතාවයක් පවතින්නේද යන්න විමසූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවූ බැවින් 2022 ජුලි මස සිට දෙසැම්බර් මස දක්වා ජයබිම උත්සව ශාලාව කම්පාස් ඇඟළුම් ආයතනය වෙත බදු පදනමින් ලබා දීමේ යෝජනාව පැමිණ සිටි සියළු මහජන නියෝජිතයන්ගේ එකඟතාවයෙන් සභා සම්මත විය.

**05. රජයේ වියදම් පාලනය කිරීම.**

<u>ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා</u> 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 3 වගන්තිය අනුව පළාත් පාලන බල ප්‍රදේශය ඇතුළත ජනතාවගේ සුබ විහරණය පහසුව හා සුභ සාධනය සියළු පහසුකම් ආරක්ෂා කිරිමට ද සියළු කරුණු විධිමත් කිරීම පාලනය කිරීම ප්‍රාදේශීය සභාව මගින් සිදු කල යුතු වුවත්, රට තුල පවතින ආර්ථික අර්බුදය හමුවේ පළාත් පාලන ආයතන විසින් ආහාර සුරක්ෂිතතාව හා වත්කම් කළමනාකරණය තිරසාර වූ සැළැස්ම සහගත වැඩපිළිවෙලක් සකස් කර පළාත් පාලන ආයතන මට්ටමින් ප්‍රදේශයේ ජනතාව වෙනුවෙන් ක්‍රියාවට නැංවීම කාලෝචිත වන බවටත්, 2022.05.31 දිනැති ලිපිය මගින් ආර්ථික අර්බුදය හමුවේ ආහාර සුරක්ෂිතතාවයට අදාල උපදෙස් මේ වන විට ලබා දී ඇත ි බවත්, 2022 සංවර්ධන සැලස්ම ක්‍රියාත්මක කිරිමේදී 2022 වර්ෂයේ අයවැය සදහා මේ වන වට යටිතල පහසුකම් සඳහා ප්‍රමුඛත්වය දී ඇත්නම් අත්‍යවශ්‍ය හා ප්‍රමුඛ වැඩ සටහන් ක්‍රියාත්මක කිරිම හා සැලසුම් සංවර්ධනය කිරිම,ආදායම්,ජීවනෝපාය සංවර්ධන,කෘෂි කාර්මික, තාක්ෂණික නොවන ස්වයං උත්පාදිත කර්මාන්ත කෙරෙහි අවධානය යොමු කල යුතු බවත්, රටේ පවතින තත්වය සලකා බැලීමේදී ඉතා ප්‍රායෝගික මෙන්ම කාලීන හා ආර්ථික සකසුරුවම් සඳහා ප්‍රමුඛතාවය ලැබිය යුතු බැවින්,මේ පිළිබදව වැඩි අවධාරණයක් යොමු කර,ඒ සදහා සුපරීක්ෂක හා අධික්ෂණ ක්‍රමවේදයක් සැලසුම් කර මහා සභා අනුමැතියක් ලබාගෙන ඉදිරි වැඩ කටයුතු සිදුකරන ලෙස පළාත් පාලන දෙපාර්තමේන්තුව විසින් දන්වා ඇති බවත්, සඳහන් කරමින් සුදුසු වැඩ පිළිවෙලක් සකස් කිරීම සුදුසු බවට යෝජනා කරන ලදී.

තවද යහලේගම කොම්පෝස්ට් ව්‍යාපෘතිය සිදු කළ ඉඩම අප ප්‍රදේශීය සභාවට පවරා දෙන මෙන් ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට ලිපියකින් දැන් වූ අතර කැබිනට් අනුමැතියකින් එය ලබා දීමට කටයුතු කරන බව ප්‍රකාශ කරන ලද බවත්, එය ලබා ගත් පසුව ඒහි කොම්පෝස්ට් ව්‍යාපෘතිය මෙන්ම ගොවිපලක් පවත්වාගෙන යාමට කටයුතු කරන බව ද දන්වා සිටින ලදී.

<u>ගරු මන්ත්‍රී කුමුදු ප්‍රියන්ත මැතිතුමා</u> පවතින තත්වය හමුවේ කෘෂි කර්මාන්තය කෙරේ අවධානය යොමු කිරීම වඩාත් යෝග්‍ය බව සඳහන් කරන ලදී.

<u>ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා</u> ඉදිරිපත් කල යෝජනාව සම්බන්ධයෙන් යම් විරෝධතාවයක් පවතින්නේ ද යන්න විමසූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවූ බැවින් **රජයේ වියදම් පාලනය කිරීමේ** යෝජනාව වෙනුවෙන් කෘෂිකර්මාන්තය කෙරේ අවධානය යොමු කිරීම සඳහා පැමිණ සිටි සියළු මහජන නියෝජිතයන්ගේ එකඟතාවයෙන් සභා සම්මත විය.

**06 බ්ලොක් ගල් නිෂ්පාදන යන්ත්‍රයේ මිළ ගණන් සංශෝදනය කිරීම.**

<u>ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා</u>. පළාත් පාලන අමාත්‍යාංශය යටතේ මෙම ප්‍රාදේශීය සභාවට අවශ්‍ය බ්ලොග් ගල් නිෂ්පාදන යන්ත්‍රය මිල දී ගැනීම වෙනුවෙන් හිමි වූ ප්‍රතිපාදන මුදල වන රු 38,50,000 ක ප්‍රමාණයට අවශ්‍ය බ්ලොග් ගල් යන්ත්‍රය මිල දී ගැනීමට තීරණය කර ඇතත්, අදාල මිල ගණන් ඉදිරිපත් කර ඇති ආයතනය විසින් රටේ පවතින තත්වය හමුවේ අදාල මිල යටතේ සැපයීමට නොහැකි අතර එය වර්ථමානය වන විට රු 58,00,000 දක්වා ඉහල ගොස් ඇති බව ප්‍රකාශ කරමින් අදාල මිල යටතේ මිල දී ගැනීම සුදුසු බවට යෝජනා කරන ලදී.

<u>ගරු මන්ත්‍රී ඩී.පී බන්දුලසේන මැතිතුමා</u> මෙම සභාවේ මීට පෙරද මෙවැනි යෝජනා ගෙනවිත් ඒවා ක්‍රියාත්මක කල බවත් ඒ යොජනා ගෙනෙන විටද ඒම ව්‍යාපෘති තුලින් විශාල ආදායමක් ඉපයිය හැකි බව ප්‍රකාශ කලත් ඒවාගෙන් විශාල ආදායමක් උපයා නොමැති බව ප්‍රකාශ කරන ලදී. තවද වාහන සේවා මධ්‍යස්ථානය, ආර්ථික මධ්‍යස්ථානය හා බ්ලොක් ගල් නිශ්පාදනාගාරය තුලින් ඒ ලෙස පෙන්වා දුන් ආදායම් උපයා නොමැති බවත් ප්‍රකාශ කරමින් ඒ නිසා මෙම යෝජනාව ක්‍රියාත්මක කිරීමට ප්‍රථම ඒ පිළිබඳ සලකා සක්‍යතා වාර්තාවක් ලබා ගෙන කටයුතු කිරීම සුදුසු බවට ප්‍රකාශ කරන ලදී.

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා රටේ වර්ථමාන පොදු තත්වය මත යම් ගැටළු ඇති වුවත් මෙම සභාවේ සිදු කල ව්‍යාපෘති වලින් හොඳ ආදායමක් ඉපැයූ බව ප්‍රකාශ කල අතර තුරුලිය සෙවන නිවාඩු නිකේතනය, බ්ලොග් ගල් නිෂ්පාදන මධ්‍යස්ථානය, ජල පිරිපහදු මධ්‍යස්ථානය මගින් හා වාහන සේවා මධ්‍යස්ථානය මගින් බාහිර පාර්ශවයන්ට ගෙවන මුදල් ඉතිරි කර ගනිමින්, සභා කටයුතු හා කම්කරු වැටුප් පවා ගෙවූ බවට ප්‍රකාශ කරන ලදි.

ගරු මන්ත්‍රී බී.බී.ඊ ගයාන් චාමර මැතිතුමා මේ වන තෙක් අසාර්ථක ව්‍යාපෘති සිදු කල නොමැති බවත්, රටේ පැවති විවිධ ආර්ථික තත්වයන් මත ඒවායේ ගැටළු ඇති වුවත් ජනතාවට ඉන් විශාල සේවාවක් සිදු වූ බව සඳහන් කරන ලදි. තවද බ්ලොක් ගල් නිශ්පාදනාගාරය මේ දිනවල පවතින සිමෙන්ති හිඟතාවය මත නතර වුවත් එය ඉතා ඵලදායි බවත් ප්‍රකාශ කරමින් ගරු සභාපතිතුමා විසින් ගෙන ආ යෝජනාව ස්ථිර කරන ලදී.

ගරු මන්ත්‍රී ඩී.පී බන්දුලසේන මැතිතුමා පෙ.ව. 11.05 ට ගරු සභාවෙන් පිටව යන ලදි

ගරු මන්ත්‍රී එස්.ඒ.කේ.පී ගුණවර්ධන මැතිතුමා බ්ලොක් ගල් යන්ත්‍රයක් මෙම අවස්ථාවේ මිලදී ගැනීම සුදුසු නැති බවත් රටේ වර්ථමාන තත්වය මත එය මිලදී ගැනීම තාවකාලකව නතර කරන ලෙසත් ප්‍රකාශ කරන ලද අතර වෙන්ව ඇති ප්‍රතිපාදන වලින් වෙනත් ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කල හැකි දැයි යන්න සොයා බලන මෙන් ප්‍රකාශ කරන ලදි. එමෙන්ම මෙම අවස්ථාවේ කෘෂිකර්මාන්තය වැනි දෙයක් රටට අවශ්‍ය බවත් මෙම යෝජනාවට තමන් ඇතුළු තම පක්ෂය විරුද්ධ බවත් ප්‍රකාශ කරන ලදි.

ගරු මන්ත්‍රී ජේ.ඒ.ඩී විමලසිරි මැතිතුමා පෙ.ව. 11.10 ට ගරු සභාවෙන් පිටව යන ලදි.

ගරු මන්ත්‍රී ආර්.එම් කුමාරසිංහ මැතිතුමා ආදායම් උත්පාදනය වෙනුවෙන් ක්‍රියාත්මක කරන ව්‍යාපෘතියක් ලෙසට මෙම ව්‍යාපෘතිය පෙන්වා දිය හැකි බවත්, වර්තමාන රටේ තත්වය මත මෙය නතර වුවත් දීර්ඝ කාලීනව ඒසේ නොවී මින් ආදායම් ඉපයිය හැකි බැවින් මෙම යන්ත්‍රය මිල දී ගැනීම සුදුසු බවට ප්‍රකාශ කරන ලදී.

ගරු මන්ත්‍රී පී.ටී සිරිසේන මැතිතුමා ගරු මන්ත්‍රී ආර්.එම් කුමාරසිංහ මැතිතුමාගේ ප්‍රකාශය නිවැරදි බවත් ඒම යන්ත්‍රය මිලට ගැනීමේ යෝජනාව සුදුසු බවටත් ප්‍රකාශ කරන ලදි.

ගරු මන්ත්‍රී කේ.ඒ සංජීව මැතිතුමා බ්ලොග් ගල් ව්‍යාපෘතිය වෙනුවෙන් ලබා දෙන මුදල නැවත වෙනත් ව්‍යාපෘතියකට ලබා ගැනීමට නොහැකි නිසා මෙම යන්ත්‍රය පවතින මිල අනුව මිලදී ගැනීම සුදුසු බවට ගරු සභාපතිතුමා ගෙන ආ යෝජනාව ස්ථිර කරන ලදි.

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා ඉදිරිපත් කල යෝජනාව සම්බන්ධයෙන් යම් විරෝධතාවයක් පවතින්නේ ද යන්න විමසූ අතර ගරු මන්ත්‍රී කුමුදු ප්‍රියන්ත මැතිතුමා හා ගරු මන්ත්‍රී කේ හැරිසෙන්ස් මැතිතුමාගේ එකඟතාවයෙන් තොරව බ්ලොක් ගල් නිෂ්පාදන යන්ත්‍රයේ පවතින මිළ ගණන් අනුව මිල දී ගැනීමේ යෝජනාව පැමිණ සිටි බහුතර මහජන නියෝජිතයන්ගේ එකඟතාවයෙන් සභා සම්මත විය.

**07. නාගරික සංවර්ධන අධිකාරිය යටතේ පවත්වනු ලබන සැළසුම් කමිටු දීමනාව වැඩි කිරීම.**

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා නාගරික සංවර්ධන, අපද්‍රව්‍ය බැහැරලීම හා ප්‍රජා පවිත්‍රතා කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය විසින් පළාත් පලන ආයතන මට්ටමින් පවත්වාගෙන යන සැළසුම් කමිටුවට සහභාගී වන කමිටු සාමාජිකයින් වෙත ගෙවනු ලබන පැමිණීමේ දීමනාව රු 1500 සිට රු 2500 දක්වා වැඩි කර ලබා දීම

සම්බන්ධයෙන් අමාත්‍යාංශයේ විරුද්ධත්වයක් නොමැති බවට ප්‍රකාශ කර ඇති බැවින් අදාල පැමිණීමේ දීමනාව 2022 ජුලි මස සිට 2500 දක්වා වැඩි කිරීම සුදුසු බවට යෝජනා කරන ලදී.

තවද මෙම ගෙවීම් කිරිමේදී ආයතනයට ලැබෙන පෙරසැරි ගාස්තු මුදල නොඉක්මවිය යුතු බවත්, මෙම අදිකාරිය මගින් සැළසුම් කමිටු පැවැත්වීම සම්බන්ධව නිකුත් කර ඇති චක්‍රලේඛ අනුකූල විය යුතු බවත් සඳහන් කරන ලදී.

ගරු මන්ත්‍රී බී.බී.ර් ගයාන් චාමර මැතිතුමා ගරු සභාපතිතුමා විසින් ගෙන ආ කමිටු දීමනාව වැඩි කිරීමේ යෝජනාව ස්ථිර කරන ලදී

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතමා ඉදිරිපත් කල යෝජනාව සම්බන්ධයෙන් යම් විරෝධතාවයක් පවතින්නේ ද යන්න විමසූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවූ බැවින් සැලසුම් කමිටු දීමනාව වැඩි කර ගැනීමේ යෝජනා ව පැමිණ සිටි සියළු මහජන නියෝජිතයන්ගේ එකඟතාවයෙන් සභා සම්මත විය.

**08. ජල පිරිපහදු මධ්‍යස්ථානයේ ජලය ලීටර් 01 ක මිළ සංශෝධනය කිරිම.**

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා ප්‍රාදේශීය සභාවට අයත් නෙළුබැව ජල පිරිපහදු මධ්‍යස්ථානයේ හා ප්‍රාදේශීය සභා භූමියේ පිහිටි ජල පිරිපහදු මධ්‍යස්ථානයේ ජලය ලීටර 1 ක මිල රු 1.50 ලෙස විකිණීම සිදු කලත් වර්ථමානයේ පවතින මිල විචලනයන් සැලකිල්ලට ගෙන එය රු 2.00 ලෙසට සංශෝධනය කිරිම සුදුසු බවට යෝජනා කරන ලදි.

ගරු මන්ත්‍රී බී.ඒ.ජී.එම්.කේ.ජී .ජී කුමාරිහාමී මැතිණිය ගරු සභාපතිතුමා විසින් ගෙන ආ යෝජනාව ස්ථිර කරන ලදී

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා ඉදිරිපත් කල යෝජනාව සම්බන්ධයෙන් යම් විරෝධතාවයක් පවතින්නේ ද යන්න විමසූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවූ බැවින් ප්‍රාදේශීය සභාවට අයත් නෙළුබැව ජල පිරිපහදු මධ්‍යස්ථානයේ හා ප්‍රාදේශීය සභා භූමියේ පිහිටි ජල පිරිපහදු මධ්‍යස්ථානයේ ජලය ලීටර 1 ක මිල රු 1.50 සිට රු 2.00 දක්වා වැඩි කිරීමේ යෝජනා ව පැමිණ සිටි සියළු මහජන නියෝජිතයන්ගේ එකඟතාවයෙන් සභා සම්මත විය.

**09. කීරිකකුලම ජල පිරිපහදු මධ්‍යස්ථානයේ නළ ලිද ඉදි කිරීම සඳහා ඇස්තමේන්තුව අනුමත කිරිම.**

ගරු සභාපති එස්. බී කුමාරදාස මැතිතුමා කීරික්කුලම ජල පිරිපහදු මධ්‍යස්ථානය ස්ථාපිත කිරීමට අදාලව එම භූමියේ පිහිටි නළ ලිඳ පවිත්‍ර කිරීමේ කටයුතු ජාතික ජල සම්පාදන මණ්ඩලයේ නඩත්තු ඒකකය විසින් සිදු කලත්, එම ළිඳ මීටර් 9 ක් දක්වා පිරිසිදු කිරීමෙන් අනතුරුව ඒ දක්වා ගල් පුරවා තිබීම හේතුවෙන් පිරිසිදු කිරීමට නොහැකි වූ අතර ඒ වෙනුවට එම භූමියේ වෙනත් ස්ථානයක ස්ථාපිත කිරීම සුදුසු බැවින් ඒ සඳහා ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලයේ ඇස්තමේන්තුව ලැබී ඇතත්, එම මුදලට සාපේක්ෂව භාහිර පාර්ශවයන්ගේ මිල ගණන් අවම මට්ටමක පවතින බවට තමන් අදහස් කරන බැවින් භාහිර පාර්ශවයන්ගෙන් අදාල නළ ළිඳ ස්ථාපිත කර ගැනීමට කටයුතු කිරීම සුදුසු බවට යෝජනා කරන ලදී.

ගරු මන්ත්‍රී ජේ.ඒ ජයවර්ධන මැතිතුමා ගරු සභාපතිතුමා විසින් ගෙන ආ යෝජනාව වඩාත් සුදුසු බව ප්‍රකාශ කරමින් ඒ සඳහා භාහිර පාර්ශවයන්ගෙන් මිල ගණන් කැඳවා ප්‍රසම්පාදන ක්‍රමවේදය අනුගමනය කරමින් අදාල නළ ළිඳ ස්ථාපිත කිරීම සුදුසු බවට වූ යෝජනාව ස්ථිර කරන ලදී.

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතමා ඉදිරිපත් කල යෝජනාව සම්බන්ධයෙන් යම් විරෝධතාවයක් පවතින්නේ ද යන්න විමසූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවූ බැවින් **කීරික්කුලම ජල පිරිපහදු** මධ්‍යස්ථානයේ නළ ලිද ඉදි කිරිම සඳහා බාහිර පාර්ශවයන්ගෙන් මිල ගණන් කැඳවා ප්‍රසම්පාදන ක්‍රමවේදය

අනුගමනය කරමින් සිදු කිරීම සුදුසු බවට වූ යෝජනා ව පැමිණ සිටී සියළු මහජන නියෝජිතයන්ගේ එකඟතාවයෙන් සභා සම්මත විය.

**ඊ) කාරක සභාවල වාර්තා**

- 2022 ජුනි මස 07 වන දින මුදල් කමිටු වාර්ථාව

**සභා ගත කරන ලදී.**

**එ) ලැබීම් ගෙවීම් මාසික වාර්තා**

2022 ජුනි මස ආදායම් හා වියදම් වාර්ථා මහ සභාවේ සලකා බැලීම සිදු කරන ලදී.

**ඒ) රැස්වීම් කැඳවීමේ දැන්වීම් හා වෙනත් කාරණා ඉදිරිපත් කිරීම.**

**01. නිවාඩු දැනුම් දීම.**

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා ගරු උප සභාපති එම් සරත් ප්‍රේමචන්ද්‍ර මැතිතුමා ,ගරු මන්ත්‍රී කේ.ඒ ශාන්ත මැතිතුමා ,ගරු මන්ත්‍රී ආර්.එම්.අයි ජනක ශ්‍රිමාලි මැතිනිය, ගරු මන්ත්‍රී වයි.එම් ගාමිණී බංඩාර මැතිතුමා, ගරු මන්ත්‍රී පී කරුණාරත්න මැතිතුමා, ගරු මන්ත්‍රී ජී. ඒ නෙළුම් මැතිනිය ගරු සභාවට නොපැමිණෙන බවට දන්වා ඇති බව මහ සභාවට ප්‍රකාශ කරන ලදී.

ගරු මන්ත්‍රී කුමුදු වසන්ති මැතිණිය අදාල නිවාඩු ඉල්ලුම් කර ඇති ගරු සභිකවරුන් වෙත නිවාඩු ලබා දීම සුදුසු බව සඳහන් කරන ලදී.

ගරු මන්ත්‍රී බී.ඒ.ජී.එම්.කේ.ජී.ජී කුමාරිහාමි මැතිණිය මේ දිනවල තම කොට්ඨාශයේ වීදි ලාම්පු අලුත්වැඩියාව සිදු නොකරන අතර, ඒ සම්බන්ධයෙන් ගරු සභාපතිතුමාගෙන් විමසීමේදී රටේ පවත්නා විදුලි අර්බුදය හේතු කරගෙන විදුලිය පිරිමැසීම වෙනුවෙන් එය කරන බව ප්‍රකාශ කල නමුත් ආයතනය තුල සේවය කරන එක් සේවිකාවක් විදුලි උපකරණ ගබඩාව තුල පවතින බවටත් වීථි ලාම්පු සකස් කරන බවටත්, තම කොට්ඨාශයේ ඇතැම් පිරිස් වෙත ප්‍රකාශ කර ඇති බවත්, බීජ බෙදා දිමේ වැඩසටහනේද තමන්ගේ බල ප්‍රදේශයේ සමහර ඉල්ලුම් පත්‍ර, එම බීජ හා පොහොර විසි කර ඇති බවට ද එම සේවිකාව විසින් ප්‍රකාශ කර ඇති බවත්, එය සොයා බලන ලෙසටත්, මෙහි ගබඩා නිළධාරින් සිටියදි මෙවැනි සිදුවීම් සිදු වන්නේ කෙසේද, මෙම ප්‍රකාශය සිදු කල සේවිකාව සම්බන්ධව ගැටළුවක් පවතින බවත් ඒ පිළිබඳව තමන් බෙහෙවින් කණගාටු වන බවද ප්‍රකාශ කරන ලදි.

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා මෙම සේවිකාව සම්බන්දව සොයා බලන බවට ප්‍රකාශ කරන ලදි.

ගරු මන්ත්‍රී පී.ටී සිරිසේන මැතිතුමා 9 වනදා සිදුවීම යහපත් සිදුවීමක් නොවන බවත් ප්‍රහාර සඳහා ප්‍රතිප්‍රහාර එල්ල කිරීම නතර නොකර ඉන් අනතුරුව නිවාස පවා විනාශ කළ බවත්, මෙහිදී සමහර පිරිස් තමා දන්නා බවත්, මින් ඉදිරියට එසේ නොකරන ලෙසට ඉල්ලා සිටින ලදි. තවද කොම්පෝස්ට් පොහොර බෙදා දීම පවා වැඩකට නොවන බව ඇතමුන් ප්‍රකාශ කල බවත්, එසේ ප්‍රකාශ ඉදිරිපත් නොකරන ලෙසට ද ප්‍රකාශ කරන ලදි.

ගරු මන්ත්‍රී කේ. හැරිසෙන්ස් මැතිතුමා 9 වනදා සිදු වීම සම්බන්දව අත්තඩංගුවට පත් හා හොරකම් කල පිරිස පිළිබඳව විස්තරයක් ගෙන බලන ලෙසත්, ඒම සිදුවීම සම්බන්දව තමාව ද අත්තඩංගුවට ගැනීමට 7 දෙනෙකු පමණ පැමිණි බවත් කරුණු විමසා තමා නිවැරදි බව තේරුම් ගෙන ඔවුන් නැවත ගිය බවත් ප්‍රකාශ කරන ලදි.

තවද එම නිසා නිවැරදි තොරතුරු නොදැන ප්‍රකාශ ඉදිරිපත් නොකරන ලෙසට පැවසූ අතර තමන් ව්‍යාපාරිකයෙකු ලෙස වර්තමානයේ ආර්ථික තත්වය දන්න බවත්, කොම්පෝස්ට් ව්‍යාපෘතියට තමන් විරුද්ධ බවක් නොපෙන්නූ බවත් සඳහන් කරන ලදි

ගරු මන්ත්‍රී පී.ටී සිරිසේන මැතිතුමා පෙ.ව. 11.55 ට ගරු සභාවෙන් පිටව යන ලදි.

ගරු මන්ත්‍රී පී.එස්.බී සිරිවර්ධන මැතිතුමා තමන්ගේ කොට්ඨාශයේ බහුතරයක් ගොවීන් සිටින බවත්, මේ යල් කන්නයේ වියලි කාලගුණයත් සමග ගොවීන් විශාල අර්බුදයකට මුහුණ දී ඇති බවත්, ප්‍රකාශ කරන ලදි. එහිදී වතුර ලබා ගැනීමට මෝටර් සඳහා භූමිතෙල් නොමැති ගැටලුවක් පවතින බවත්, අධික මුදලක් වැය කොට මෙම තෙල් ලබා ගත යුතු බව හා සමහර අවස්ථාවලදී තෙල් නොමැති වීමත් විශාල ගැටලුවක් බව පැවසීය. මේ සඳහා දිස්ත්‍රික් ලේකම්තුමා, ගරු ආණ්ඩුකාරතුමා, අවධානය යොමු කර මේ සඳහා ප්‍රාදේශීය ලේකම් කාර්යාල හරහා සුදුසු ගොවීන්ට මෙම තෙල් ලබාදීමේ වැඩපිළිවෙළක් සකස් කල යුතු බව පැවසීය. එම නිසා ගරු සභාපතිතුමාගේ මැදිහත් වීමෙන් ඉහල නිළධාරීන් දැනුවත් කල හෝ මේ සඳහා විකල්පයක් ලබාදෙන මෙන් ඉල්ලා සිටින ලදි.

එමෙන්ම එදා 9 වනදා සිදුවීමෙන් යම් ජීවත හානියක් සිදු වූයේ නම් ඒ අපේ මිනිසුන් බවත්, යම් දේපළ හානියක් සිදුවූයේ නම් එය නැවත ප්‍රතිසංස්කරණය කිරීම සඳහා අපේ මුදල් වැය වන නිසාත් ඒ පිළිබඳව කණගාටුව ප්‍රකාශ කරන බවත්, පැවසීය. එම ප්‍රශ්නයේදී තමන්ටත් විශාල ගැටලු ඇති කල බවත්, එම පුද්ගලයින් සැබෑ අරගලකරුවන් නොවන බවත්, ඔවුන් වෙනත් කඩාකප්පල්කාරී පුද්ගලයින් බවත් ප්‍රකාශ කරන ලදී.

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතමා සෝලා පැනල් මගින් විදුලිය නිපදවා ජලය ලබා ගැනීමට අවශ්‍ය ව්‍යාපෘතියක් සකස් කරන බවත් 9 වනදා සිදු වීමෙන් ඇතිවූ දේපළ සහ ජීවිත විනාශය පිළිබඳව තමාගේ කණගාටුව ප්‍රකාශ කරන බවත් පැවසීය.

ගරු මන්ත්‍රී බී.බී.ඊ ගයාන් චාමර මැතිතුමා පෙ.ව. 12.00 ට ගරු සභාවෙන් පිටව යන ලදි.

ගරු මන්ත්‍රී එස්.ඒ.කේ.පී ගුණවර්ධන මැතිතුමා නව වැනි දා සිදු වීම යථාර්තවාදීව දැකීම පිළිබඳව ස්තූතිවන්ත වන බවත්, ජාතික ජන බලවේගය සම්බන්ධයි කියල පාර්ලිමේන්තුවේදීත් ප්‍රකාශ කලත් එයට ඔවුන් සම්බන්ධ නොමැති බව ඔප්පු වී ඇති බවත්, මෙම ගැටලුකාරී අවස්ථාවේදීත් ගැටුම්කාරී බව සමනය කිරීමට ඔවුන් කටයුතු කළ බවත්, කලහකාරී ලෙස ඔවුන් හැසිරුනේ නැති බවත් පැවසීය.

තවද තමන්ගේ පක්ෂය මාධ්‍ය සාකච්ඡා වලදී ගොවීන්ට කුඹුරුවලට ගොස් වැඩ කරන ගමන් පොහොර ඉල්ලමු යනුවෙන් පැවසූ බවත්, ඔවුන් පුලුවන් ආකාරයට කෘෂිකර්මාන්තය සඳහා මැදිහත් වන බවත්, ගොවීන් දිරිමත් කර වියදම් අවමයෙන් ගොවිතැන් කරන බවත් පැවසීය. නමුත් පොහොර ටිකක් සහ බීජ ටිකක් ලබා දීමෙන් මෙම ප්‍රශ්නය විසඳිය නොහැකි බවටත් ප්‍රකාශ කරන ලදී. තවද පුරන් කුඹුරු අස්වැද්දීමේ ව්‍යාපෘතියක් ආරම්භ කිරීම මගින් ගොවීන්ට යහපතක් සිදු වන බවත්, ඒ සඳහා සභාවක් වශයෙන් වියදම් දැරිය යුතු බව හා සභාවක් ලෙස ඊට සුදුසු වැඩපිළිවෙළක් සකස් කර එම පුරන් කුඹුරු අස්වැද්දීම ආරම්භ කළ යුතු බවට ප්‍රකාශ කරන ලදී. සභාවක් ලෙස එක්රැස් වී සිදුකළ යුත්තේ පක්ෂ භේද කර ගනිමින් වාද කිරීම නොව ජනතාවගේ සුබ සිද්ධිය සැලසීම බව එතුමන් වැඩිදුරටත් සඳහන් කරන ලදී. තවද අඩුම පුරන් කුඹුරු අක්කර 10 ක් හෝ වගා කිරීමට ඇරඹීම , ගොඩ කුඹුරු වල වගා කිරීමට ඇරඹීම, කොට්ඨාශවලින් හොඳ ගොවීන් කිහිප දෙනෙක් තෝරා ගෙන ඔවුන්ට බීජ නිෂ්පාදනය කිරීමට ලබාදී සභාව තුල බීජ වෙළඳපොළක් ඇති කිරීමට අවශ්‍ය කටයුතු සැලසීම යනාදී යෝජනා පෙන්වා දෙන ලදි. එමනිසා මේ තුළින් හොඳ කෘෂිකාර්මික ආර්ථිකයක් ගොඩනැඟිය හැකිබවද පැවසීය.

ගරු මන්ත්‍රී ජේ.ඒ ජයවර්ධන මැතිතුමා යල කන්නයේ යහලේගම අක්කර 180ක් පමණ ද මොරයායේ අක්කර 25ක් පමණ හා සුචරිතගම අක්කර 50 ක් පමණ වගා කරන අතර, මෙවර යහලේගම අක්කර 180 න් දහයක් නැතිව ඉතිරිය වගා කරන බවත් ඒවා දැනට හොඳ තත්වයේ පවතින බවත් පැවසීය.

නමුත් ගොඩ ගොවිතැන් සඳහා ජලය ලබා ගැනීමේදී භූමිතෙල් නොමැති ගැටලුව පවතින බවත්, මේ ගැටලුව මත බොහෝ ගොවීන් වගා කිරීම අතහැර දමා ඇති බවත් පැවසීය. සභාවක් ලෙස මෙම ගැටළුවට විසඳුම් සෙවීමට ගරු ආණ්ඩුකාරතුමා, දිස්ත්‍රික් ලේකම් තුමා හා ප්‍රාදේශීය ලේකම්තුමා දැනුවත් කර අවශ්‍ය වැඩපිළිවෙළක් සලසා දෙන මෙන් ඉල්ලා සිටිය යුතු බවට ප්‍රකාශ කරන ලදී. එහිදී හොඳින් වගා කරන ගොවි මහතුන් තෝරාගෙන භූමිතෙල් ගෙනැවිත් එම ලබාගත් මුදලට ඔවුන්ට ලබාදීමේ වැඩපිළිවෙළක් සකස් කළ හොත් හොඳ අස්වැන්නක් ලබා ගත හැකි බවට ප්‍රකාශ කරන ලදී .

ගරු මන්ත්‍රී ආර්.එම් කුමාරසිංහ මැතිතුමා සමස්ත සමාජයටම ආකල්පමය වෙනසක් අවශ්‍ය වී ඇති බවත්, අධ්‍යාපන ක්‍රමය තුල මේ සඳහා ක්‍රමවේදයක් ඇති කළ යුතු බවත්, නිෂ්පාදිත ආර්ථිකයන් සඳහා වන සාකච්ඡාවක් මේ වන විට සමාජයේ කතාබහට ලක්වන බවත්, කෘෂිකාර්මික රටක් වන අප රටේ ආහාර සුරක්ෂිතතාවය බිඳ වැටී තිබියදී වර්තමාන තත්ත්වය පිළිබඳව අප ලැජ්ජා විය යුතු බවත්, අද වන විට මුළු ලෝකයේම හිඟා කෑමට ලක් වී ඇති බවත්, මේ සඳහා ආගමික සංවිධාන දේශපාලන පක්ෂ සියල්ල වගකිය යුතු බවත්, තවද මේ සඳහා අධ්‍යාපනය තුලින් ආකල්ප සංවර්ධනය සිදු කළ යුතු බවටත් ප්‍රකාශ කරන ලදී. ශ්‍රී ලංකාව තුල මේ වන විට විශාල ජනගහන වර්ධනයක් ඇති බවත් මෙම ජනගහන වර්ධනයට සාපේක්ෂව ආහාර නිශ්පාදනය කළ යුතු වුවත් වර්තමානයේ කෘෂිකර්මාන්තය තුළ විවිධ ගැටලු පවතින බවත් පැවසීය . ලංකාව කෘෂිකාර්මික රටක් බවත්, නමුත් කාබනික පොහොර භාවිතයෙන් පමණක් වගා කළ නොහැකි බවත් ශරීරයට හිතකර රසායනික පොහොර භාවිතා කර වගා කළ යුතු බවත් ප්‍රකාශ කරන ලදී. තව ද ගොඩ බෝග වගා කර ඇති බල ප්‍රදේශයේ සෑම ගොවි මහතෙකුට ම ජල අවශ්‍යතාවය සපුරා දිය යුතු බවත්, ගරු මන්ත්‍රී කුමුදු ප්‍රියන්ත මැතිතුමා ප්‍රකාශ කළ ආකාරයටම වගා කටයුතු ආරම්භ කළ යුතු බවත්, ඒ සඳහා වහාම වගා සංග්‍රාමයක් වෙනුවෙන් අවශ්‍ය වැඩපිළිවෙළක් සකස් කළ යුතු බවත් ප්‍රකාශ කරන ලදී.

නම වනදා සිදු වූ අසික්කිත, අසීලාචාර සමාජයේ අනුමත නොකරන, කාලකණ්ණි ක්‍රියාව සම්බන්ධයෙන් සමාජය තුළ ජීවත්වන පුද්ගලයකු වශයෙන් තමා අනුමත නොකරන බවත්, ස්වභාව ධර්මයේ ප්‍රතිඵල මත අදාල පුද්ගලයින් හට වන්දි ගෙවිය යුතු බවත් ප්‍රකාශ කරන ලදී. වර්තමානයේ රට මුහුණ දී ඇති තත්ත්වයෙන් ගොඩනැගීම සඳහා අවශ්‍ය වන්නේ සමාජය හා දේශපාලන එකමුතු තාවයක් බවත්, සභාවක් ලෙස එක්වී කටයුතු කලයුතු බවත් ප්‍රකාශ කරන ලදී .

ගරු සභාපති එස්. බී කුමාරදාස මැතිතුමා මන්ත්‍රීතුමන්ලා දැක් වූ අදහස් හා යෝජනා සැලකිල්ලට ගෙන ඔවුන්ගේ ගැටලු සඳහා හැකි ඉක්මනින් ඉහළ නිලධාරීන් සමඟ සාකච්ඡා කර පිළිතුරක් ලබා දීමට කටයුතු කරන බවත්, ප්‍රාදේශීය සභාවක් වශයෙන් අපි සියලු දෙනාම එක්වී වර්තමාන තත්ත්වය සඳහා මුහුණ දිය යුතු බවත්, පුරවැසියන් ලෙස සියලු දෙනාම වග කිව යුතු බවත් ප්‍රකාශ කරන ලදී. අනතුරුව ප්‍රදේශයේ ජනතාවගේ සුභ සිද්ධිය උදෙසා තීන්දු තීරණ ගැනීම වෙනුවෙන් ගෞරවයෙන් සහයෝගය දැක්වූ ගරු මන්ත්‍රීතුමන්ලා වෙත හා ගරු මන්ත්‍රීතුමියන්ලා වෙත ස්තුතිය ප්‍රකාශ කරමින් 2022.06.17 වන දින පැවැත්වූ මහ සභා රැස්වීම ප.ව 12.45 ට අවසන් කරන ලද අතර එළඹෙන මහ සභාව 2022.07.19 වන දින පෙ.ව 10.00 පැවැත්වෙන බව ද ප්‍රකාශ කරන ලදී.

| | |
|---|---|
| ................................... | ........................................ |
| බී. එච් ප්‍රදීප් නිශාන්ත, | එස්. බී කුමාරදාස, |
| ලේකම්, | සභාපති , |
| නෑ. නු. ප ප්‍රාදේශීය සභාව, | නෑ. නු. ප්‍රාදේශීය සභාව, |
| විජයපුර. | විජයපුර. |